# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

# இலங்கை கைப்பணிகள் சபை

# Sri Lanka Handicrafts Board



LAKSALA

State Gift & Souvenir Boutique





# 2019

# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# Annual Report

LAKSALA

STATE GIFT & SOUVENIR BOUTIQUE

# වාර්ෂික වාර්තාව 2019

## ලක්සල

## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

# පටුන


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 01 |
| ලක්සල ප්‍රදර්ශනාගාර ජාලය | 02 |
| දැක්ම සහ මෙහෙවර | 03 |
| කාර්යය සමාලෝචනය සහ මෙහෙයුම් සමාලෝචනය | 04 -11 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් | 12 |
| ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම | 13 |


# මූල්‍ය වාර්තා


| | |
|---|---|
| විස්තීර ආදායම් ප්‍රකාශය | 16 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 17 |
| කොටස් හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 18 |
| මුල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 19 |
| මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 20 - 36 |
| විගණකාධිපති වාර්තාව | 37 - 46 |

# <u>සංස්ථාපිත තොරතුරු</u>

## මණ්ඩලයේ නම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

## නෛතික ආකෘතිය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනතින් සංස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

## ප්‍රධාන කාර්යාලය

අංක : 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 7

දුරකථන : 011 2557132 / 011 2055501

ෆැක්ස් : 011 2594872

## අලෙවි විමසීම්

ඊ-මේල් : info@laksala.gov.lk

වෙබ් අඩවිය : *www.laksala.gov.lk*

## අලෙවි තොරතුරු

දුරකථන : 011 2597797
ඊ-මේල් : info@laksala.gov.lk

## විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව

## බැංකු

ලංකා බැංකුව

මහජන බැංකුව

# ලක්සල ප්‍රදර්ශණාගාර ජාලය

| | | |
|---|---|---|
| 1.කොටුව | අංක. 60, යෝක් වීදිය, කොළඹ 01. | 011-2323514 |
| 2.තුම්මුල්ල | අංක.215, බෞද්ධාලෝක මාවත,තුම්මුල්ල, කොළඹ 07. | 011-2580579 |
| 3.නුවර | අංක.05, සංඝරාජ මාවත, නුවර. | 081-2222087 |
| 4.කටුබැද්ද | අංක.282, ගාලු පාර, කටුබැද්ද මොරටුව. | 011-2605600 |
| 5.ජාතික කෞතුකාගාරය | ලක්සල, කෞතුකාගාර පරිශ්‍රය, කොළඹ 07. | 011-2698263 |
| 6.බත්තරමුල්ල | අපේ ගම, පැලවත්ත, බත්තරමුල්ල. | 011-2786026 |
| 7.වැලිපැන්න I | දක්ෂිණ අධිවේගී මාර්ගය,විරාම මන්දිරය සේවා පෙදෙස "බී", ඒ5 සහ ඒ6, වලගෙදර වැලිපැන්න. | 034-2241607/8 |
| 8. ගාල්ල | අංක.74/1, සමුද්‍ර මාවත, ගාල්ල. | 091-2222783 |
| 9.පින්නවල | අලි අනාථාගාරය, පින්නවල. | 035-2265015 |
| 10.පේරාදෙණිය | අංක.14, උද්භිද උද්‍යානය, පේරාදෙණිය. | 081-2389253/63 |
| 11.කටුනායක | 54 ඩී, සංක්‍රමණික වෙන්ව යාමේ කලාපය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, ,කටුනායක. | 011-2260167 |
| 12.නුවරඑළිය | අංක. 79 පරණ උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය. | 052-2234445 |

# අපේ දැක්ම

ශ්‍රී ලංකාවේ ත්‍යාග සහ සමරු භාණ්ඩ වෙළඳපල ප්‍රමුඛයා බවට පත්වීම.

# අපේ මෙහෙවර

**ත්‍යාග සහ සමරු භාණ්ඩ ක්ෂේත්‍රය තුළ වර්ධනීය අවස්ථා පුළුල් කරමින් සහ සංචාරක කර්මාන්තයට උසස් වටිනාකම් එකතු කළ දායකත්වයක් සපයමින් ග්‍රාමීය නිපැයුම්කරුවන්හට පුළුල් වෙළඳපල අවස්ථා විවර කරමින් සමාජ වගකීම ඉටුකරන වාණිජ වශයෙන් සඵලදායී ආයතනයක් බවට පත්වීම**

.

# අපේ කේන්ද්‍රීය වටිනාකම්

- තත්වය, විශ්වසනීයත්වය සහ මුදලට වටිනාකම.
- විවිධ වූ මානයන්ගෙන් යුක්තව හොඳම පාරිභෝගික තේරීම උදෙසා අවස්ථා සම්පාදනය.
- ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් නිර්මාණය සහ වටිනාකම් හුවමාරුව.
- පාරිභෝගිකයා උපරිම ලෙස තෘප්තිමත් කිරීම.

# තිරසර සංවර්ධන ඉලක්ක

- 2030 වසර වනවිට දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන නිපැයුම් ප්‍රමාණය දෙගුණ කරමින් දේශීය නිර්මාණ ප්‍රවර්ධනය.
- 2030 වසර වනවිට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කරගැනීමේ අරමුණින් ලක්සල භාණ්ඩ සපයන කාන්තා සැපයුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව 50% කින් වර්ධනය කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාව දිරිගැන්වීම පිණිස 2030 වසර වනවිට විශේෂ අවශ්‍යතා ඇති සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව 25% කින් වර්ධනය කිරීම.




දේශීය අත්කම් නිපැයුම්කරුවන් හට දේශීය මෙන්ම විදේශීය වෙළඳපල අවස්ථා විවර කිරීමේ අරමුණින් 1964 වසරේදී ලක්සල ආයතනය ස්ථාපිත කරන ලද අතර 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් එය සංස්ථාපිත කරන ලදී. මෙකී ක්ෂේත්‍රය තුළ මේ වන විට ලක්සල රජය සතු පැරණිතම සහ විශාලතම ජාලය බවට පත්ව තිබේ.

**<u>මූල්‍ය කාර්ය සාධන සාරාංශය</u>**

2019 සමාලෝචිත වර්ෂය තුළ, රුපියල් 617,296,345.00 ක මුළු පිරිවැටුමක් ලක්සල වාර්තා කර ඇති අතර එහි විකුණුම් පිරිවැය රුපියල් 258,401,407.00 කි. පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් පසුගිය වසර පහක කාලය තුළ ලක්සලහි  මුළු විකුණුම්වල සාරාංශය ඉදිරිපත් කෙරේ.




2019 වර්ෂය තුළ සිදු කරන ලද විකුණුම් විශ්ලේෂණය කිරීමේදී, රුපියල් 265,742,091.00 ක වටිනාකමක් වාර්තා කරමින් තුම්මුල්ල ප්‍රදර්ශනාගාරය ප්‍රදර්ශනාගාර විකුණුම් සඳහා ප්‍රධානතම දායකයා බවට පත් වූ අතර රු 76,213,119.00 ක පිරිවැටුමක් වාර්තා කරමින් කෞතුකාගාර ප්‍රදර්ශනාගාරය ඊළඟ ප්‍රධාන දායකයා බවට පත්විය.




**<u>මිලදී ගැනීම් විශ්ලේෂණය</u>**

2019 වර්ෂය තුළ ලක්සල මඟින් රු.313,668,623.00 ක් වටිනා වෙළඳ මිලදී ගැනීම් සිදු කර ඇත. පහත ප්‍රස්ථාරයෙන් දැක්වෙනුයේ පසුගිය වසර පහ තුළ වෙළඳ මිලදී ගැනීමේ ප්‍රවණතාවයයි.



පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන්, 2019 වර්ෂයේ දී මිලදී ගැනීම් අයිතම වර්ගීකරණයට අනුව තවදුරටත් නිරූපණය කෙරේ. 2019 වෙළඳ මිලදී ගැනීම් විශ්ලේෂණය කිරීමේදී වෙළඳ මිලදී ගැනීම් වලින් ඉහළ ප්‍රතිශතයක් කලා සහ ශිල්ප අංශය නියෝජනය කරයි.




**වියදම් විශ්ලේෂණය**

2019 වර්ෂයේ දී පිරිවැය අඩු කිරීමේ පියවරයන් අනුගමනය කළ බැවින්, මුළු වියදම රුපියල් මිලියන 420 දක්වා අඩු කරන ලද අතර එය පෙර වසරට සාපේක්ෂව 1.3% ක වර්ධනයකි.

| වියදම් | 2018 | 2019 |
|---|---|---|
| පරිපාලන වියදම් | 313,643,115 | 292,262,229 |
| බෙදා හැරීමේ වියදම් | 56,287,682 | 53,802,840 |
| මූල්‍ය පිරිවැය | 51,289,163 | 74,588,320 |
| බදු | 5,149,100 | - |
| | ***426,369,060*** | ***420,653,389*** |

පහත දැක්වෙන ප්‍රස්ථාර මඟින් පෙර වර්ෂයට සාපේක්ෂව සමස්ත වියදම්වල සංයුතිය දක්වනු ලබයි.






# ·කාර්ය සාධන සමාලෝචනය - 2019 වර්ෂය

## පසුබිම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල 2019 වර්ෂයේ කාර්ය සාධන සමාලෝචනය සතුටින් ඉදිරිපත් කරමි. දේශීය හස්තකර්මාන්ත නිර්මාණකරුවන්ට දෙස් විදෙස් වෙළඳපල අවස්ථා ඇති කරලීමේ අරමුණ පෙරදැරිව ලක්සල ආයතනය 1964 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් ස්ථාපිත කොට ඇත. ලක්සල මෙම ක්ෂේත්‍රයේ රජය සතු පැරණි සහ විශාලතම අලෙවි ජාලය බවට මේ වන විට පත්ව ඇත.

උපාය මාර්ගික ප්‍රවේශය,

ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් තුළින් තම පිරිවැටුම හා ලාභදායීත්වය මෙන්ම තිරසාර පැවැත්මක් සඳහා අත්‍යාවශ්‍ය, පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කරගත් අතර අවශ්‍යතාවයන්ට සහ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය කටයුතු කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. එනම්,

- තම අලෙවිකරණ භාණ්ඩ කාණ්ඩ පුළුල් කරමින් නව වෙළඳපලක් ලබාගැනීම (Category Expansion).
- සන්නම්කරණය (Branding) තුලින් ආයතනයේ නාමය වෙළඳපළ තුළ ස්ථාපනය කිරීම.
- සංග්‍රහශීලී පාරිභෝගික සේවයකට අවශ්‍ය ආකාරයට සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප හා කුසලතා ගොඩනැංවීම.
- අන්තර්ජාලය හරහා ලක්සල භාණ්ඩ මිලදී ගැනීමේ පහසුකම් තව දුරටත් වර්ධනය කිරීම. (Online sales Facilities)
- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය වැනි ආයතන හා පෞද්ගලික සංචාරක ආයතන සමඟ නිරතුරුව සම්බන්ධතා පවත්වා ගෙනයමින් ලක්සල ප්‍රදර්ශනාගාර සඳහා විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීමේ කටයුතු සංවිධානය කිරීම.

ලක්සල වෙළඳනාමය යටතේ හඳුන්වා දෙන ලද ලක්සල ප්‍රදර්ශනාගාර තුල අලෙවි කරනු ලබන සියලුම භාණ්ඩ පෙළ තවදුරටත් පුළුල් කරන අතර ඒවා ගුණාත්මක හා උසස් තත්වයේ තැගි හා සමරු භාණ්ඩ ලෙසින් දෙස් විදෙස් පාරිභෝගිකයන්ට පහසුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු තවදුරටත් පුළුල් කරනු ඇත. ඒ අනුව ඉතා උසස් තත්වයේ නවීන විලාසිතා වලින් අනූන භාණ්ඩ රාශියක් අලෙවිය සඳහා ප්‍රදර්ශනය කරන අතර ලක්සල ශ්‍රී ලංකාවේ තැගි හා සමරු භාණ්ඩ අලෙවිකරණයේ එකම රාජ්‍ය හා ප්‍රධාන වාණිජ ආයතනයක් බවට දෙස් විදෙස් පාරිභෝගිකයන්ගේ හදවත් තුළ රඳවා තබා ගැනීමට අවශ්‍ය අලෙවිකරණ කටයුතු පුළුල් කොට පාරිභෝගිකයින් ආයතනය කරා තව තවත් ආකර්ෂණය කර ගැනීම හා රඳවා තබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

### සන්නම්කරණය තුලින් ආයතනයේ නාමය වෙළඳපල තුළ ස්ථාපනය කිරීම

ලක්සල තම අලෙවි ප්‍රදර්ශනාගාර වර්තමාන වෙළඳපොළට සරිලන ආකාරයෙන් ඉතා උසස් මට්ටමකට පත් කරන ලදී. ඒ අනුව ලක්සල ප්‍රදර්ශනාගාර නවීකරණය කර දෙස් විදෙස් පාරිභෝගික ආකර්ශනය ඇතිවන පරිදි ඉතා ඉහළ මට්ටමකට පත් කිරීම මෙන්ම ලක්සල වෙළඳ නාමය යටතේ නිෂ්පාදන හඳුන්වා දෙමින් භාණ්ඩ ප්‍රදර්ශනය ඉහළ මට්ටමක පවත්වාගැනීම හා සන්නම්කරණය තුලින් අපේක්ෂිත අලෙවි ඉලක්ක සපුරා ගැනීමටද කටයුතු කරන ලදී.

## සංග්‍රහශීලී පාරිභෝගික සේවාවකට අවශ්‍ය වන පරිදි සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප ගොඩනැංවීම.

පාරිභෝගික අවශ්‍යතා හදුනා ගනිමින් ඔවුන් හට සංග්‍රහශීලී සේවයන් ලබා දීම සඳහා නව වෙළඳපොළට සරිලන ආකාරයට කටයුතු කළ හැකි සේවක මඩුල්ලක් පවත්වා ගැනීමට කටයුතු කිරීම සහ අවශ්‍ය නිසි පුහුණුව මෙන්ම පෙළඹවීම ඇති කිරීම තුළ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. ඒ අනුව වැටුප් හා දීමනා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව මත සිදුකිරීම තුලින් ඔවුන්ගේ උනන්දුව වර්ධනය කිරීම, තවදුරටත් ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට බොහෝ දුරට උපකාරී වී ඇත.

### නිෂ්පාදන අයිතමයන් පුළුල් කිරීම

නව උපාය මාර්ගික වැඩ පිළිවෙළ යටතේ ආයතනයේ කාර්යයන් පමණක් නොව තම වෙළඳ භාණ්ඩ කාණ්ඩයන්ද පුළුල් කිරීම සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව සහ අනෙකුත් අදාල රාජ්‍ය ආයතන සමඟ එක්ව අවශ්‍යය පියවර ගන්නා ලදී. දේශීය නිෂ්පාදනවල අනන්‍යතාවය රැකගනිමින් වර්තමාන වෙළඳපළ අවශ්‍යතා සඳහා නව නිර්මණ ඉතා උසස් තත්වයෙන් යුතුව නිර්මාණය කොට වෙළඳපළට හඳුන්වා දීම හා මෙම තෑගි සහ සමරු භාණ්ඩ කාණ්ඩයන්ට මැණික් සහ ස්වර්ණාභරණ, තේ, කුළු බඩු, සම් භාණ්ඩ, පිගන් භාණ්ඩ මෙන්ම දේශීය වෙස් මුහුණු සහ අනෙකුත් සමරු නිර්මාණ හඳුන්වා දුන් අතර ලක්සල නව නිර්මාණ අංශය විසින් ද නව අත්කම් නිපැයුම් හඳුන්වා දීම තුලින් තෑගි හා සමරු භාණ්ඩ ක්ෂේත්‍රයේ නව නිර්මාණ රාශියක් එළි දැක්වීමට කටයුතු කරන ලදී.

### සැපයුම් ජාලය

ලක්සල සැපයුම් ජාලය මගින් ප්‍රදර්ශනාගාරවල අලෙවි කිරීමට අවශ්‍ය තෑගි හා සමරු භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම එම භාණ්ඩ නිෂ්පාදනය සැලසුම් කිරීම් තත්ව පාලනය හා නවීන මෝස්තර ලබා දීම ද ඇතුළත් වේ. 2018 වර්ෂයේ අවසන් වන විට ක්‍රියාකාරී සැපයුම්කරුවන් සංඛ්‍යාව 797ක් පමණ වූ සමස්ත දේශීය හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව මෙම වසර තුළ තවදුරටත් වර්ධනය වී ඇති අතර නව වෙළඳපළ අවස්ථා වැඩි දියුණු කිරීම තුළින් නව නිෂ්පාදකයින් හට මෙම ක්ෂේත්‍රය තුළට පිවිසීමට අවස්ථාවන් පුළුල් කරන ලදී.

### පරිපාලනය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සමස්ථ මෙහෙයුම් කටයුතු වලට අදාල අණපනත් , රාජ්‍ය චක්‍රලේඛ හා අනෙකුත් මූල්‍ය හා පරිපාලන උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක කරන ලද අතර යහපාලන හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව කටයුතු කිරීමටද තහවුරු කරන ලදී.සංවිධානයේ ඉලක්ක හා පරමාර්ථ ලගාකර ගැනීම උදෙසා මෙන්ම අනෙකුත් සහායක සේවාවන් සැපයීම පිනිස පරිපාලන සහ මානව සම්පත් අංශය සැලකිය යුතු කාර්යභාර්යයක් ඉටුකරන ලදී.අදාල සමාලෝචනිත වර්ෂය තුල කාර්යය මණ්ඩලය අදාල සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩලය 129කින් සමන්විත වන අතර එහි විස්තර පහත සඳහන් වේ.

**2019/12/31 දිනට සමස්ථ කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | **08** | |
| ද්විතික මට්ටම | **08** | |
| තෘතික මට්ටම | **57** | |
| ප්‍රාථමික මට්ටම | **10** | **83** |
| | | |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | | **46** |
| මුළු ගණන | | **129** |

පෙර වසර සමඟ සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩල තත්ත්වය **135** සිට **129** දක්වා අඩු වී ඇත. තරඟකාරී අලෙවි පරිසරය තුළ මනාලෙස සකසන ලද කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන ව්‍යාපාර සැලැසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා වන ප්‍රයත්නයේදී මනා ලෙස පුහුණුව ලදල කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම යන්න තීරක කාර්යභාරයක් ඉටු කරයි.

අලෙවි කාර්ය මණ්ඩලය මෙන්ම සහාය කාර්ය මණ්ඩලය වෙත ආකර්ශණීය දිරිදීමනා ක්‍රමයක් හඳුන්වාදෙමින් සහ ඔවුන්හට පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සේවකයින්ගේ ගුණාත්මක භාවය සහ ඵලදායකත්වය වර්ධනය කිරීමට පියවර ගණු ලැබිණි.මීට අමතරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ආයතනයේ මෙහෙයුම් කටයුතු වලට සරිලන පරිදි නව සේවක සංඛ්‍යාවක් අනුමත කර ගැනීමට ඉල්ලුම් කොට ඇත.

මෙම වසරේ අප්‍රේල් **21** වන දින එල්ලවූ ත්‍රස්තවාදී පාස්කු බෝම්බ ප්‍රහාරය හේතුවෙන් දිවයිනට පැමිණෙන විදේශීය සංචාරකයින් බොහෝ සෙයින් අඩුවූ අතර ඒ හේතුවෙන් සැලසුම්කර තිබූ අලෙවි ඉලක්ක සපුරාගැනීමට අපහසුවූ හෙයින් අපේක්ෂිත අදායම උත්පාදනය කර ගැනීමට නොහැකි විය.

එහෙත් **2020** වසරේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම යථාවත් වනු ඇතැයි අපේක්ෂා කරන හෙයින් නව සැලැස්මක් යටතේ අලෙවි සහ විකුණුම් තවදුරටත් වර්ධනය කිරීමට අවශ්‍ය සියලුම උපාය උපක්‍රම ක්‍රියාත්මක කරමින් ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

| අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන්ගේ නම් | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| සුජීව පල්ලියගුරුගේ මයා | සභාපති | 2020/12/31 |
| අයි.ජේ. අබේරත්න මිය | මණ්ඩල සාමාජික | 2019/04/30 |
| මාතරගේ නයනචන්ද්‍ර මයා | මණ්ඩල සාමාජික | 2018/08/10 |
| ජී.ඩී.එස්.පී. කුමාර මයා | මණ්ඩල සාමාජික | 2018/08/29 |
| ඒ.ඒ.ඒ. රුවායිස් මයා | මණ්ඩල සාමාජික | 2018/10/18 |
| එච්.එම්. එම් රුවායිත් මයා | මණ්ඩල සාමාජික | 2018/10/19 |
| ආචාර්ය එම්.එම් වසිර් මයා | මණ්ඩල සාමාජික | 2018/03/21 |
| | | (ඉවත් වූ දිනය) |
| එම්. හම්සා මයා | සභාපති (ඉල්ලා අස් වූ) | 2018/07/13 |
| හර්ෂ විජේවර්ධන මයා | මණ්ඩල සාමාජික | 2019/04/29 |

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල
# ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම

| | |
|---|---|
| මධුර ද සිල්වා මහතා | අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක |
| සී.එන්.දහනායක මහතා | අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන) |
| කේ.සී.ජයවර්ධන මහතා | අධ්‍යක්ෂ (විකුණුම්) |
| ඊ.ඇලන් ඩෙලිල්කන් මහතා | වැඩ බලනඅධ්‍යක්ෂ (මුදල්) |
| කේ.පී.පී.එස් කේ. පතිරණ මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| දේවිකා කුමාරි අතුකෝරළ මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (බෙදාහැරීම්) |
| වජිරා සමරරත්න මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) |
| සම්පත් සෙනෙවිරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන) |
| දිනේෂ් අබේකෝන් මහතා | තොරතුරු තාක්ෂණ අංශ ප්‍රධානී |
| ඒ.එල්.එම් රිස්වාන් මහතා | සහකාර අධ්‍යක්ෂ (ආදායම් හා වියදම්) |

## අපේ කෘතඥතාව

පළමුව මම ලක්සල වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමා හට මහත් කෘතවේදීත්වය පුදදෙනු කැමැත්තෙමි. අප ආයතනය ක්ෂේත්‍රයෙහි ඉහලම ස්ථානයකට නංවාලනු පිණිස නිරතුරු ඇවැසි තීරණ සහ නිගමනයන් ලබාදීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් අවශ්‍ය තීන්දු තීරණ ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්හටද කෘතවේදීත්වය පුදනු කැමැත්තෙමි.

තවද, අවශ්‍ය සෑම අවස්ථාවකම අප ආයතනයේ ප්‍රගතිය උදෙසා ලබාදුන් සහය වෙනුවෙන් මම අප අමාත්‍යාංශයේ ලේකම්තුමාට කෘතවේදීත්වය පළ කර සිටිමි.

එමෙන්ම ආයතනයේ පරිපාලන, මූල්‍ය සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඵලදායීව තම සේවක මණ්ඩලය මෙහෙයවූ අංශ ප්‍රධානීන්ට මෙන්ම ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට දායකත්වය ලබාදෙන ලද අනෙකුත් සමස්ථ කාර්ය මණ්ඩලය වෙතද මාගේ ස්තූතිය පුද කරමි.

අප සමග අත්වැල් බැඳගනිමින් පාරිභෝගික අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන, නව නිපැයුම් හඳුන්වා දෙමින්, සම්ප්‍රදායික මෙන්ම නව්‍ය වූ නිපැයුම් ඇතුළුව අත්කම් සහ සමරු භාණ්ඩ සපයමින් අප හා එක්වූ නිපැයුම්කරුවන්ට මෙහිදී විශේෂ ස්තූතිය පුද කරනු කැමැත්තෙමි. එසේම සෑම අවස්ථාවකම අප ආයතනය මත විශ්වාසය රැඳවූ දේශීය මෙන්ම විදේශීය ගණුදෙනුකරුවෝද අපේ විශේෂ ස්තූතියට හිමිකම් ලබති.

මෙම වසරේ අප්‍රේල් 21 දින සිදුවූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් විදේශීය සංචාරකයින් නොපැමිණීම නිසා ආයතනයේ අලෙවි ආදායම සීඝ්‍රයෙන් පහළ වැටීම සිදුවිය. එම නිසා අපේක්ෂිත අලෙවි ඉලක්ක කරා යාමට මෙම වසරේ නොහැකිවූ නමුත් 2020 වසර තුළ අලෙවි සහ විකුණුම් තවදුරටත් වර්ධනය කිරීම උදෙසා අවශ්‍ය වන විශේෂඥ සේවා ලබාගනිමින් ආයතනයේ අලෙවිය පුළුල් කිරීමට මම අපේක්ෂා කරමි.

අනාගතයේදී ශ්‍රී ලාංකික ග්‍රාමීය ආර්ථිකය සවිමත් කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වයන් නගා සිටුවීමට ඇවැසි සියළු පියවර අප ආයතනය මගින් ගනු ලබන බව ප්‍රකාශ කරන අතරම ඉදිරි වසරවලදී අපගේ අලෙවිය රුපියල් බිලියනයක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරන බවද අවසන් වශයෙන් පවසමි.

තවද, ආයතනයේ මානව සම්පත මෙන්ම භෞතික සම්පත්ද ක්‍රමිකව කළමණාකරනය කිරීම හරහා සමස්ත කාර්ය මණ්ඩලයෙන්ම කාර්යක්ෂම සහ සඵලදායී දායකත්වය ලබාගනු පිණිස සකසන ලද උපායමාර්ගික සැලසුමකට අනුව ආයතනයේ පොදු කාර්ය පිරිවැය සැලකිය යුතු මට්ටමකින් පහත හෙලමින් 2020 වසර තුළ අපගේ ලාභ ප්‍රතිශතය වර්ධනය වන තත්වයක පවත්වා ගැනීමටද සැලසුම් සකස් කර ඇත.

සභාපති,

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

LAKSALA

State Gift & Souvenir Boutique

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

## මූල්‍ය ප්‍රකාශන

**2019 දෙසැම්බර් 31**

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**

**2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| | සටහන් | 2019<br>රු | 2018<br>රු |
|---|---|---|---|
| ආදායම | 3 | 617,296,345 | 737,283,033 |
| විකුණුම් පිරිවැය | | (258,401,407) | (306,324,003) |
| **දළ ලාභය** | | **358,894,938** | **430,959,030** |
| ප්‍රදාන ලැබීම් | | 150,000,000 | - |
| වෙනත් ආදායම් | 4 | 10,806,240 | 11,851,544 |
| පරිපාලන වියදම් | | (292,262,229) | (313,643,115) |
| බෙදාහැරීමේ වියදම් | | (53,802,840) | (56,287,682) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ප්‍රතිඵල** | | **173,636,109** | **72,879,777** |
| මූල්‍ය පිරිවැය | 5 | (74,588,320) | (51,289,163) |
| **බදු පෙර ලාභය** | 6 | **99,047,789** | **21,590,614** |
| බදු | 7 | - | (5,149,100) |
| **වර්ෂය සඳහා ලාභය** | | **99,047,789** | **16,441,514** |

පිටු අංක 9 සිට 25 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයෙහිම අනිවාර්ය අංගයක් වේ. වරහන් තුළ සඳහන් සංඛ්‍යා මඟින් අඩු කිරීම් දැක්වේ.

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**
**2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 947,265,898 | 993,113,357 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **947,265,898** | **993,113,357** |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 9 | 637,430,580 | 463,384,277 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 10 | 86,360,169 | 108,718,915 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 28,929,936 | 24,451,300 |
| **මුළු ජංගම වත්කම්** | | **752,720,685** | **596,554,492** |
| **මුළු වත්කම්** | | **1,699,986,583** | **1,589,667,849** |
| | | | |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 73,628,878 | 73,628,878 |
| ප්‍රාග්ධන සංචිත | | 510,806 | 510,806 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 454,366,157 | 454,366,157 |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 103,951,172 | 103,951,172 |
| ආදායම් සංචිතයේ වෙනත් සංරචක | 12 | (123,528,974) | (178,017,763) |
| රඳවාගත් ඉපැයුම් | | 104,814,488 | 5,766,701 |
| **මුළු හිමිකම්** | | **613,742,527** | **460,205,951** |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳුම් | 13 | 50,896,038 | 44,191,479 |
| විලම්බිත ආදායම | 14 | 74,844,712 | 100,184,713 |
| දීර්ඝ කාලීන ණය | 15 | 388,650,929 | 164,610,344 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **514,391,679** | **308,986,536** |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 16 | 490,309,677 | 524,046,871 |
| ගෙවිය යුතු ආදායම් බදු | 7 | 25,459,280 | 5,149,100 |
| කෙටි කාලීන ණය | 17 | 49,762,719 | 275,388,387 |
| බැංකු අයිරා | 18 | 6,320,701 | 15,891,004 |
| **මුළු ජංගම වගකීම්** | | **571,852,377** | **820,475,362** |
| **මුළු වගකීම්** | | **1,086,244,056** | **1,129,461,898** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **1,699,986,583** | **1,589,667,849** |

..................................................
ටී. ඒ. ඩෙලිකන් මයා
**අධ්‍යක්ෂ (මුදල්) (වැ.බ.)**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් 2020 සැප්තැම්බර් 22 දින ලක්සල, කුඹුමුල්ල හි පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| ................................ | ................................ | ................................ |
| එස්. එම්. කොඩිකාර මයා | එන්.පී.ඒ.ආර්. ජයවර්ධන මිය | සුජීව පල්ලියගුරුගේ මයා |
| **මණ්ඩල සාමාජික** | **මණ්ඩල සාමාජික** | **සභාපති** |

පිටු අංක 9 සිට 25 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයෙහිම අනිවාර්ය අංගයක් වේ. වරහන් තුළ සඳහන් සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**

**2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රාග්ධන ප්‍රදාන | රඳවාගත් ඉපැයුම් | පෙර වර්ෂයේ ගැළපුම් | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | | රු. | රු. |
| **2018 ජනවාරි 1 දිනට ශේෂය** | 73,628,878 | 510,806 | 454,366,157 | 103,951,172 | (10,674,814) | (38,180,995) | **583,601,204** |
| | | | | | | | - |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 16,441,514 | | **16,441,514** |
| | | | | | | | - |
| පෙර වර්ෂයේ වැරදිවල ආරම්භක ශේෂය | | | | | | (139,836,768) | **(139,836,768)** |
| පෙර වර්ෂයේ වැරදි සඳහා ගැළපුම් | - | - | - | - | | | - |
| | | | | | | | - |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **73,628,878** | **510,806** | **454,366,157** | **103,951,172** | **5,766,700** | **(178,017,763)** | **460,205,950** |
| | | | | | | | - |
| වර්ෂය සඳහා ලාභය | | | | | 99,047,789 | | **99,047,789** |
| | | | | | | | - |
| පෙර වර්ෂයේ වැරදි සඳහා ගැළපුම් | - | - | - | | | 54,488,789 | **54,488,788** |
| ප්‍රදාන | | | | - | | | - |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **73,628,878** | **510,806** | **454,366,157** | **103,951,172** | **104,814,488** | **(123,528,974)** | **613,742,527** |

පිටු අංක 9 සිට 25 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයෙහිම අනිවාර්ය අංගයක් වේ. වරහන් තුළ සඳහන් සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**

**2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | රු | රු |
| බදු පෙර ලාභය | | **99,047,789** | **21,590,614.00** |
| **ගැළපුම්** | | | |
| වත්කම් අපහරණ ආදායම | | (127,716) | - |
| ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රමක්ෂය කිරීමේ ගාස්තු | | 2,465,874 | 3,278,092.00 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | | 6,964,310 | 6,704,212.00 |
| පොළී වියදම් | | 74,236,920 | 51,289,163.00 |
| ක්ෂය වීම් | | 25,928,260 | 24,329,921.00 |
| ප්‍රාග්ධන වියදම් පිරිවැය ක්‍රමක්ෂය කිරීම | | 25,340,000 | 25,340,000.00 |
| පෙර වර්ෂයේ ගැළපුම් | | (77,794,472) | (7,553,507.00) |
| ක්‍රමක්ෂිත ප්‍රදාන | | (25,340,000) | (25,340,000.00) |
| | | **130,720,965** | **99,638,495.00** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| තොග | | (41,763,042) | (16,718,542.00) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | | 19,892,872 | 84,467,185.00 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | | (11,905,275) | (28,819,050.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | **96,945,520** | **138,568,088.00** |
| ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයට ගෙවීම් | | | - |
| පාරිතෝෂික ගෙවීම් | | (573,540) | (574,994.00) |
| පොළී ගෙවීම් | | (74,236,920) | (51,289,163.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **22,135,060** | **86,703,931.00** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| වත්කම් අපහරණ ආදායම | | 164,256 | - |
| දේපළ, පිරියත හා උපකරණ මිලට ගැනීම | | (6,665,294) | (2,117,152.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(6,501,038)** | **(2,117,152.00)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| දීර්ඝ කාලීන ණය ගැනීම් | | 273,000,000 | 15,824,872.00 |
| ණය ආපසු ගෙවීම් | | (274,585,083) | (72,254,789.00) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(1,585,083)** | **(56,429,917.00)** |
| **මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩු වීම)** | | **14,048,939** | **28,156,862.00** |
| වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 8,560,296 | (19,596,566.00) |
| **වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **22,609,235** | **8,560,296.00** |
| බැංකු අයිරා | **18** | (6,320,701) | (15,891,004.00) |
| අතැති මුදල් සහ බැංකු මුදල් | **11** | 28,929,936 | 24,451,300.00 |
| | | **22,609,235** | **8,560,296.00** |

පිටු අංක 9 සිට 25 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයෙහිම අනිවාර්ය අංගයක් වේ. වරහන් තුළ සඳහන් සංඛ්‍යා මඟින් අඩු කිරීම් දැක්වේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.0 සමාගම

“ලක්සල” යන වෙළඳ නාමය යටතේ ජනප්‍රියත්වය ලැබ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) ශ්‍රී ලංකාව පුරා නිපදවනු ලබන අත්කම් භාණ්ඩ අලෙවි කිරීමේ කටයුතුවල යෙදෙන රජය සතු එකම ආයතනයයි.

1.1 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම් ස්වභාවය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ මූලික කටයුතු වනුයේ දේශිය හා විදේශිය වෙළඳපොළට ත්‍යාග හා සැමැරුම් භාණ්ඩ අලෙවි කිරීමයි.

2. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.0 මිනුම්කරණ පදනම

2018 දෙසැම්බර් 31 දිනට සහ අවසන් වූ වර්ෂයට අදාළව ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් (මූල්‍ය ප්‍රකාශන) ද සමඟ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලව සකස් කොට ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන, සාධාරණ වටිනාකමින් මනිනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් හැර ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීමට අවශ්‍ය වේ. සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කොට ඇත.

2.1 ගිණුම්කරණ ඇස්තමේන්තු, උපකල්පන හා විනිශ්චයන් භාවිතා කිරීම

ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි සහ වාර්තාගත වත්කම් හා බැරකම් සහ ආදායම් හා වියදම් අගයන් කෙරෙහි බලපාන අයුරින් කළමනාකාරිත්වයට ඇස්තමේන්තු, උපකල්පන හා විනිශ්චයන් සිදු කිරීමට, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අවශ්‍ය වේ. ඇස්තමේන්තු හා ඒ සම්බන්ධ උපකල්පන, පෙර අත්දැකීම් සහ පවතින තත්ත්වයන් යටතේ සාධාරණ යැයි සැලකෙන අනෙකුත් සාධක මත පදනම් වන අතර එහි ප්‍රතිඵල, අනෙකුත් මූලාශ්‍රවලින් පහසුවෙන් මතු නොවන ඉදිරියට රැගෙන එන වත්කම් හා බැරකම් අගයන් පිළිබඳ විනිශ්චයන් සිදු කිරීමට පදනම් වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ ඊට පාදක වූ උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන, එම සංශෝධන බලපානුයේ ඇස්තමේන්තුව සංශෝධිත කාලපරිච්ඡේදය සඳහා පමණක් නම් එම කාලපරිච්ඡේදයේ දී හඳුනා ගනු ලබන අතර සංශෝධන වර්තමාන හා අනාගත යන කාලපරිච්ඡේද දෙකටම බලපාන්නේ නම් සංශෝධිත කාලපරිච්ඡේදයේදී හා අනාගත කාලපරිච්ඡේදයන් හි දී ද හඳුනා ගනු ලැබේ.

2.2 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ආයතනය අනාගතයේ සාර්ථක ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යාම උදෙසා ආයතනයේ වත්කම් පිළිබඳ ඇගයීමක් සිදු කරන ලදී. අනාගතයට බලපාන්නා වූ පවතින සියලු තොරතුරු පිළිබඳ සළකා බැලීමේදී වත්කම් විකිණීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක පෙරනිමිත්තක් දක්නට නොලැබේ.

2.3 සංසන්දනාත්මක තොරතුරු

ආයතනය මඟින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිරතුරුවම ක්‍රියාවට නංවා ඇති අතර එය පෙර වර්ෂයේ භාවිතා කළ ප්‍රතිපත්තිවලට අනුකූල වන අතර ඒවා අවශ්‍ය අවස්ථාවන්හිදී සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා වර්ගීකරණය කර ඇත.

### 2.4 විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලු ම කාල පරිච්ඡේදයන්ට අඛණ්ඩව අදාළ වන අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුව ම ක්‍රියාත්මක කර ඇත.

#### 2.4.1 ආදායම් හඳුනා ගැනීම

සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට අවස්ථාව ඇති ප්‍රමාණයට ආදායම හඳුනා ගෙන ඇති අතර ඒ අනුව විශ්වසනීය ලෙස ආදායම ගණනය කළ හැකිය. ගිණුම්ගත කරන ලද අදාළ බදු ගැළපීම් කළ ලැබිය යුතු ශුද්ධ වෙළඳ වට්ටම්වල සාධාරණ අගය මත ආදායම ගණනය කෙරේ.

විදේශ මුදලින් සිදු කෙරෙන ගනුදෙනුවලදී එම ගනුදෙනු සිදු වන අවස්ථාවේ පවතින විදේශ විනිමය අනුපාතය අනුව විනිමය පරිවර්තනය කරනු ලැබේ.

ශේෂ පත්‍රයේ විදේශ මුදලින් දක්වා ඇති මූල්‍ය වත්කම් හා බැරකම් එම දිනයේ පවතින විදේශ විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කෙරේ.

#### 2.4.2 දේපළ, පිරියත සහ උපකරණ

(අ) හඳුනා ගැනීම හා මිනුම්කරණය

වත්කම හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට අවස්ථාව පවතී නම් හා වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස ගණනය කළ හැකි නම්, ඒ මත දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම පදනම් වේ.

ඉඩම් හැරුණු කොට අනෙකුත් දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය අඩු කළ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අනුව දක්වා ඇත. එවැනි පිරිවැය සඳහා වත්කම් අත්පත් කරගැනීම සඳහා ඍජුවම ආරෝපණය වන වියදම් ඇතුළත් වේ. ආයතනය විසින්ම ඉදි කළ වත්කම්වල පිරිවැයට අමුද්‍රව්‍ය සඳහා වූ පිරිවැය, ඍජු ශ්‍රමය, අවශ්‍ය කටයුත්ත සඳහා එම වත්කම ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම සඳහා ඍජුව වැය වූ වෙනත් පිරිවැය සහ කොටස් වෙන්කිරීම හා ඉවත් කිරීම සහ ඒවා පිහිටි ස්ථානවල ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වූ පිරිවැය ද ඇතුළත් වේ. කිසියම් දේපළ, පිරියත හා උපකරණයකට අයත් අයිතමයක විවිධ භාවිතයෙන් යුතු ප්‍රධාන උපාංග අන්තර්ගත වන්නේ නම් ඒවා දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතම ලෙස සළකනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවල ඉදිරියට ගෙන එන අගයන්, එය පවතින අවස්ථා හා වෙනස්කම් මත ඇතිවන තත්ත්වයන් මත යථා තත්ත්වයට පත් කළ නොහැකි ලෙස දැක්වෙන අවස්ථාවන්හි දී හානිකරණයක් ලෙස සමාලෝචනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ අපහරණය කිරීම තුළින් ලැබෙන ලාභ හෝ පාඩු, එකී අයිතමයන් විකිණීමෙන් ලැබෙන මුදල් හා වත්කම් හි ඉදිරියට ගෙන එන ශේෂයන් සැසඳීමෙන් ගණනය කරන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

(ආ) ක්ෂයවීම්

ක්ෂයවීම් සඳහා වෙන් කිරීම්, ඒවා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයෙන් කපා හැරීම සඳහා, සින්නක්කර ඉඩම් හැරුණු කොට අන් සියලු දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය මත සරළ සමානුපාතික ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලැබේ.

භාවිතා කරනු ලබන ප්‍රධාන අනුපාතයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | ගොඩනැඟිලි | 2.5% |
| 2. | යන්ත්‍රෝපකරණ | 10% |
| 3. | තොග අයිතම | 10% |
| 4. | ගෘහභාණ්ඩ හා උපාංග | 10% |
| 5. | පරිගණක දෘඩාංග හා මෘදුකාංග | 20% |

(ඇ) දේපළ, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ / අලාභ

දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ හෝ අපහරණයේ ඉපැයීම් හෝ අලාභ, විකිණීම සිදු කෙරෙන කාලසීමාව තුළ හඳුනා ගනු ලබන අතර එය වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස වර්ගීකරණය කෙරේ.

2.4.3. කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වර්ෂය තුළ සිදු වන එහෙත් මූල්‍ය ප්‍රකාශනයේ දිනය වන විට නිම නොකළ ප්‍රාග්ධන වියදම් අත්තිකාරම් ගෙවීම් ලෙස දැක්වෙන අතර වර්ෂය තුළ නිම කොට භාවිතයට ගැනුණු ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණවලට මාරු කෙරේ.

2.4.4. අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මඟින් අත්පත් කරගන්නා වූ නිශ්චිත ප්‍රයෝජනවත් ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, පිරිවැය අඩු කළ සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ මත මනිනු ලබයි.

(අ) හඳුනා ගැනීමේ පදනම

වත්කමක් හා බැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ හිමිකම් ලෙස ගලා එන බවට සම්භාව්‍ය වේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි අතර පිරිවැය අඩු කළ සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ මත ඉදිරියට ගෙන ආ හැකි නම්, ඒවා අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ.

(ආ) පසුකාලීන වියදම්

පසුකාලීන වියදම් ප්‍රාග්ධනිත කරනුයේ ඊට සම්බන්ධ නිශ්චිත වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන විට පමණි. අභ්‍යන්තරික වශයෙන් ජනනය කරනු ලබන කීර්තිය හා සන්නාම මත වන වියදම් ද ඇතුළු අනෙකුත් සියලු වියදම් ආදායම් ප්‍රකාශය තුළ දරන ලද වියදම් ලෙස හඳුනා ගැනේ.

(ඇ) ඉවත් කිරීම හා අපහරණය

අස්පෘශ්‍ය වත්කමක්, බැහැර කිරීමේ දී හෝ ඉන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපෙක්ෂා නොකරන විට හා අපහරණය කිරීමෙන් පසු එය ආයතනයෙන් ඉවත් වූ ලෙස සැළකේ.

(ඇ) ක්‍රමක්ෂය කිරීම

අස්පෘෂ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත ජීව කාලය අනුව ඒවා භාවිතයට ලැබෙන දින සිට, සරල සමානුපාතික ක්‍රමය පදනම්ව ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය කිරීම හඳුනා ගැනේ.

2.4.5. හානිකරණය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වත්කම්වල ඉදිරියට ගෙන එන අගයන්, කිසියම් හානිකරණය පිළිබඳ ඇඟවීමක් පවතින්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා එක් එක් මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍ර දිනයන්හි දී සමාලෝචනය කරනු ලබයි. එසේ එවැනි ඇඟවීමක් පවතී නම් එම වත්කම යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන මුදල ඇස්තමේන්තු කෙරේ. වත්කමක ඉදිරියට ගෙන එන අගය හෝ එහි මුදල් ජනනය කිරීමේ ඒකකය එම වත්කම යථා තත්ත්වයට පත් කිරීමේ මුදල ඉක්මවන ඕනෑම අවස්ථාවක එය හානිකරණ අලාභ ලෙස හඳුනා ගැනේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.4.6. වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී අලෙවි කළ භාණ්ඩ හෝ ඉටු කළ සේවාවන් වෙනුවෙන් පාරිභෝගිකයන්ගෙන් ලැබීමට නියමිත මුදල්, වෙළඳ හා ලැබිය යුතු දෑ වේ. එම එකතුව වසරක් හෝ ඊට අඩු (හෝ ඊට වැඩි නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ) කාල සීමාවක් තුළ අපේක්ෂිත නම් ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. එසේ නොමැති නම් ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

2.4.7. තොග

තොග ගණනය කෙරෙනුයේ අභාවික හා අලුත්වැඩියා කළ හැකි අයිතම සඳහා වෙන් කිරීමෙන් පසු එහි අඩුම අගය හා ලැබිය හැකි ශුද්ධ අගය අනුවයි. බර තැබූ සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමය භාවිතයෙන් පිරිවැය නිශ්චය කරනු ලැබේ. ලැබිය හැකි ශුද්ධ අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී තොග විකිණිය හැකි මිලයි.

2.4.8. මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණු සඳහා පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලී ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස අර්ථකථනය කෙරෙන අතර අතැති මුදල් හා ඉතිරි ශුද්ධ බැංකු අයිරා, කෙටි කාලීන ණය සහ කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සමාන ලෙස සැළකේ.

2.4.9. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක එල්.කේ.ඒ.එස්. 07 (LKAS 07) මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වක්‍ර ක්‍රමය භාවිතයෙන් සකස් කොට ඇත.

2.4.10. සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා වූ වගකීම, නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් වන අතර 2018 කාල සීමාව තුළ ආයතනයේ සේවකයන් 164 දෙනෙකු ඉන් ආවරණය විය. මෙම වගකීම ඉටු කිරීම සඳහා සේවකයෙකුගේ පළමු සේවා වසරේ සිට සම්පූර්ණ කරනු ලබන එක් එක් වර්ෂය සඳහා මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ මාසික වැටුපෙන් අඩක් වන මුදල මත පදනම්ව සියලු සේවකයන් සඳහා ගණනය කරනු ලබන අගයට සමාන මුදලක් මූල්‍ය ප්‍රකාශයේ දිනට ඉදිරියට ගෙන එනු ලබයි. වර්ෂ ආරම්භයේ ඉදිරියට ගෙන ආ ප්‍රතිපාදනය සහ වර්ෂ අවසානයේ ඉදිරියට ගෙන යන ප්‍රතිපාදනය අතර ඇති වන වෙනස පිළිබඳ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ කටයුතු කෙරේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(ආ) නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි අනුව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකත්ව සඳහා සේවකයෝ හිමිකම් ලබති. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය, සේවකයන්ගේ දළ සේවා නියුක්තිය සඳහා සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට පිළිවෙලින් 12% හා 3% බැගින් දායක වේ.

**2.4.11.** ණය

ආරම්භයේ දී ණය සාධාරණ අගයකට දැරූ ශුද්ධ ගනුදෙනු පිරිවැය මත හඳුනා ගැනේ. පසුකාලීනව ඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂිත පිරිවැය මත ණය සටහන් කරයි. තවද, ශුද්ධ ගනුදෙනු පිරිවැය හා මුක්ත අගය අතර වෙනසක් වෙතොත් කාලච්ඡේදය පුරාවට එය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

**2.4.12.** බැරකම් හා ප්‍රතිපාදන

පෙර සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ නෛතික / ව්‍යුහාත්මක බැඳීමක් පවතින විට හා ඒ හේතුවෙන් සම්පත්වල ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යෑමක් අපේක්ෂිත අවස්ථාවේ දී මූල්‍ය ප්‍රකාශන තුළ බැඳීම් හා ප්‍රතිපාදන හඳුනා ගැනේ. ණයහිමියා ඉල්ලූ විට හෝ මූල්‍ය ප්‍රකාශනයේ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම බැරකම් ලෙස සැලකේ. මූල්‍ය ප්‍රකාශනවල දින සිට වසරකට පසු ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්වයේ විස්තීරණ ප්‍රකාශය තුළ ජංගම නොවන බැරකම් ලෙස සැලකේ.

(අ) වෙළඳ හා වෙනත් ගෙවිය යුතු

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සැපයුම්කරුවන් වෙතින් ලබා ගත් භාණ්ඩ හා සේවා සඳහා ඔවුන් වෙත ගෙවීමට බැඳී සිටින මුදල් වෙළඳ ගෙවිය යුතු දැ වේ. එම ගෙවීම වසරක් හෝ ඊට අඩු කාල සීමාවක් තුළ (හෝ ඊට වැඩි නම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ) සිදු කළ යුතු නම් එම ගිණුම් ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කෙරේ. එසේ නොමැති නම් ඒවා ජංගම නොවන බැරකම් ලෙස ඉදිරිපත් කෙරේ.

ලක්සල, භාර දුන් තොග ද ඇතුලත්ව සියලු මිලදී ගැනීම් සඳහා භාණ්ඩ භාරගත් බවට සටහන් නිකුත් කරන අවස්ථාවේදීම ගිණුම් පොත්වල බැරකම් වාර්තා කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරයි. කෙසේ නමුත් භාරදුන් තොගය විකිණීමෙන් පසු පමණක් අදාළ ණයහිමියා වෙත එහි ගෙවීම සිදු කරනු ලබයි.

**2.4.13.** ආදායම් බදු

වර්තමාන ආදායම් බදු ආදායම, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය බද්දට යටත් ආදායමක් මෙහෙයවන හා ජනනය කරනු ලබන විට රටේ පනවා ඇති හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට නියම වන පරිදි පැනවෙන බදු නීති මත පදනම්ව ගණනය කෙරේ. අදාළ බදු නීතිය අර්ථකථනයට බඳුන් වන අවස්ථාවන් සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වරින්වර බදු ආපසු ගෙවීමේ තත්ත්වයන් ඇගයීම සිදුකරයි. එමඟින් බදු බලධාරීන් වෙත ගෙවීමට අපේක්ෂිත මුදල් මත පදනම්ව සුදුසු අවස්ථාවල ප්‍රතිපාදන හඳුනා ගැනේ.

**2.4.14** ආදායම් හඳුනාගැනීම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදලේ සාධාරණ අගයට හා එහි ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ගලා එන බවට සම්භාවිතාවක් ඇත්නම් සහ ආදායම, දරන ලද හෝ දරනු ලබන සම්බන්ධිත පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ඒ අනුව ආදායම හඳුනාගැනේ. ලැබුණු හෝ ලැබිය යුතු දැ, වෙළඳ වට්ටම්වල ශුද්ධ අගය, ආපසු ලැබීම්, ප්‍රතිපාදන හා අදාළ බදු පිළිබඳ සළකමින් ආදායම මනිනු ලැබේ. ආදායම හඳුනා ගැනීමේ දී පහත දැක්වෙන විශේෂ නිර්ණායකයන් ද පූර්ණ කළ යුතුවේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

භාණ්ඩ විකිණීම

ලැබුණු හෝ ලැබිය යුතු ආපසු ලැබීම්, වෙළඳ වට්ටම් සහ ප්‍රතිපාදනවල ශුද්ධ අගයන්හි සාධාරණ වටිනාකමට අනුව භාණ්ඩ විකිණීමේ ආදායම ගණනය කෙරේ. සැළකිය යුතු අවදානම් හා අයිතියේ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත පැවරී ඇත්නම්, එම මුදල පියවා ගත හැකි නම්, සම්බන්ධිත පිරිවැය හා භාණ්ඩ ආපසු ලැබීම් විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි නම් සහ භාණ්ඩ සමඟ කළමනාකාරිත්වයේ අඛණ්ඩ මැදිහත්වීමක් නොවේ නම් එවැනි අවස්ථාවලදී ආදායම හඳුනා ගැනේ. එක් එක් විකිණුම් ගිවිසුමේ කොන්දේසි මත අවදානම් හා ප්‍රතිලාභ පැවරීම වෙනස්වීම පදනම් වේ.

අනෙකුත් මෙහෙයුම් ආදායම්

අ) දේපළ, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ හා අලාභ

ආ) දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ හෝ අපහරණය කිරීමේ ලාභ හෝ අලාභ එම විකුණුම් කාල සීමාව අනුව හඳුනා ගැනෙන අතර වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස ඒවා වර්ගීකරණය කෙරේ.

ලැබුණු ප්‍රදාන

රජයේ ප්‍රදානය වියදම් අයිතමයක් හා සම්බන්ධ නම් එම කාල සීමාව තුළ පිරිවැයට ගැළපිය යුතු හානිපූරණය කිරීමට අපෙක්ෂිත ආදායමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමකට සම්බන්ධ වන අවස්ථාවේ දී එහි සාධාරණ වටිනාකම විලම්බිත ආදායම් ගිණුමකට බැර කරන අතර අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය තුළ සමාන වාර්ෂික වාරික මඟින් ආදායම් ප්‍රකාශයට එය මුදා හැරේ.

ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන

ලැබුණු ප්‍රාග්ධන ප්‍රධාන විලම්භිත ආදායම් ලෙස හඳුනා ගෙන ඇති අතර වසර 10ක කාල සීමාවක් තුළ ක්‍රමක්ෂය කොට ඇත.

ලැබුණු පුනරාවර්තන ප්‍රදාන

ආදායමට අදාළ ප්‍රදාන " වෙනත් ආදායම" ලෙස වෙනම වාර්තා කිරීම හෝ අදාළ වියදම්වලින් අඩු කිරීම සිදු කෙරේ.

**2.4.15.** වියදම් හඳුනා ගැනීම

දරන ලද පිරිවැය හා ආදායමේ විශේෂ අයිතමවල ඉපැයීම් අතර පවතින ඍජු සහසම්බන්ධතාවය මත පදනම්ව ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගැනේ. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී හා දේපළ, පිරියත හා උපකරණ ඵලදායී ලෙස නඩත්තු කිරීමේදී දැරීමට සිදුවන සියලු වියදම්, ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

"වියදම්වල ක්‍රියාකාරිත්වය" ක්‍රමය, එමඟින් සමාගමේ හා සමූහයේ කාර්යසාධනයේ මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කෙරේ යන පදනමින් ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා යොදා ගැනේ.

අ) පුනරාවර්තන වියදම්

ආදායම් ප්‍රකාශයේ දැක්වෙන පරිදි මණ්ඩලය විසින් ඉපැයූ ආදායම, පවතින සියලු බැරකම් සහ දේපළ, පිරියත හා උපකරණ ක්ෂය වෙනුවෙන් වෙන් කිරීමෙන් පසු ලද අගය වේ.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආ) ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් පුළුල් කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කටයුතුවලදී හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ධාරිතාව ඉහළ නැංවීමේ කටයුතුවලදී දරන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ.

දේපළ, පිරියත හා උපකරණ අපහරණයේ ඉපැයීම් හෝ අලාභ ආදායම් ප්‍රකාශය තුළ සළකා බලා ඇත.

ඇ) විලම්බිත වියදම්

ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, සේවකයන් 20 දෙනෙකු පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 10 යටතේ ලබා දුන් ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය තෝරා ගත් අතර ඒ සඳහා රු. 10,432,332.25ක මුදලක් වැය වී ඇත. ඉතිරි සේවා කාලය තුළ පිරිවැය ලියා හැරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් යොදා ගන්නා ලදී. ඒ අනුව එක් එක් සේවකයා වෙනුවෙන් වැය වූ පිරිවැය ඉතිරි සේවා කාලය පුරාවට සමාන පදනමින් ලියා හැරීම කරන ලදී.

**2.4.16.** ණය පිරිවැය

ණය පිරිවැය, එම ණය ලබා ගත් වර්ෂයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

**2.4.17.** බැඳීම් සහ අවිනිශ්චිතතාවයන්

අතීත හේතුන් මත ඇති විය හැකි හා අනාගත අවිනිශ්චිත අවස්ථාවන් මත සිදු වීම හෝ නොවීම මත පමණක් එය තහවුරු වන්නා වූත් මණ්ඩලයේ පාලනයෙන් තොර වූත් වත්කම් හෝ බැඳීම්, අවිනිශ්චිතතාවයන් වේ.

**2.4.18.** ශේෂ පත්‍ර දිනයට පසු සිදුවන සිදුවීම්

සියලු පසු ශේෂ පත්‍ර වැදගත් සිදුවීම් අනාවරණය වූ ලෙස සළකා අදාළ පරිදි ගැළපුම් සිදුකෙරේ.

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| **3.** **ආදායම** | **2019** | **2018** |
|---|---|---|
| | රු | රු |
| **ප්‍රදර්ශනාගාර අලෙවිය** | | |
| තුම්මුල්ල | 265,742,091 | 314,092,034 |
| කෞතුකාගාරය | 76,213,119 | 93,089,687 |
| ගාල්ල | 60,187,419 | 67,105,575 |
| පේරාදෙණිය | 54,632,521 | 62,476,801 |
| කටුනායක | 33,397,236 | 42,980,562 |
| කොටුව | 28,098,047 | 27,723,597 |
| වැලිපැන්න - 1 | 32,087,176 | 26,942,621 |
| බත්තරමුල්ල | 18,543,344 | 21,321,945 |
| නුවර | 15,160,845 | 20,912,924 |
| කටුබැද්ද | 15,415,364 | 16,061,827 |
| පින්නවල | 10,473,120 | 14,247,433 |
| සුපර්බ්‍රෑන්ඩ් | - | 11,993,455 |
| තුරඟ තරඟ පිටිය | - | 3,859,365 |
| නුවර එළිය | 3,341,825 | 847,604 |
| **මුළු ප්‍රදර්ශනාගාර අලෙවිය** | 613,292,107 | 723,655,430 |
| සෘජු/අභිරුචි කරන ලද ඇණවුම් | 9,066,676 | 17,855,513 |
| | **622,358,783** | **741,510,943** |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) | (5,062,438) | (4,227,910) |
| | **617,296,345** | **737,283,033** |

| **4.** **වෙනත් ආදායම්** | | |
|---|---|---|
| කුලී ආදායම | 10,727,613 | 11,786,674 |
| ඉතිරිකිරීමේ ගිණුම සඳහා පොළී | 78,627 | 50,318 |
| සංචාරක බංගලා වෙන්කිරීම් | - | 2,500 |
| විදේශ විනිමය ලැබීම් | - | 12,052 |
| | **10,806,240** | **11,851,544** |

| **5.** **මූල්‍ය පිරිවැය** | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 345,488 | 378,449 |
| අයිරා පොළී | 5,912 | 95,374 |
| ණය පොළී | 74,236,920 | 50,815,340 |
| | **74,588,320** | **51,289,163** |

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**6. බදු පෙර ලාභය**
පහත සඳහන් දෑ ද ඇතුළුව සියලු වියදම් අය කිරීමෙන් පසු බදු පෙර ලාභය ගණනය කර ඇත..

| | 2019 | 2018 |
|---|---|---|
| | රු | රු |
| අධ්‍යක්ෂක ගාස්තු හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම් | 1,301,166 | 1,273,960 |
| විගණන ගාස්තු | 1,567,992 | 1,568,720 |
| විගණන නොවන සේවා - වෙනත් | | - |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය | 25,928,260 | 24,329,922 |
| කාර්ය මණ්ඩල පිරිවැය- | | |
| නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය | 10,277,712 | 9,818,356 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 6,964,310 | 6,704,212 |
| වැටුප් හා දීමනා | 119,426,444 | 115,989,192 |
| සේවක පුහුණු හා සංවර්ධන පිරිවැය | 279,589 | 201,500 |
| නීති ගාස්තු | 891,040 | 1,328,213 |
| මෙහෙයුම් කල්බදු කුලී | 36,212,970 | 44,555,559 |
| අනුග්‍රාහකත්ව හා පරිත්‍යාග | - | 268,778 |

**7. බදු**
ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ බදු තත්ත්වය ඇගයීමේදී ආයතනයේ නෛතික ස්වභාවය, සංකීර්ණතා හා මෙහෙයුම්වල අනන්‍යතාවය හේතු කොට ගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා පවත්වන විධිමත් උපදේශනයක් හරහා සිදු කළ යුතු ය. කෙසේ නමුත්, මූල්‍ය වර්ෂයේ ලාභයක් පැවතිය ද, 2019 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදානයෙන් උපයන ලද ලාභය සැලකිල්ලට ගනිමින් බදු ප්‍රතිපාදනයක් ගණනය කර නොමැත. මෙය වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කරන ලදී.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**8. දේපළ, පිරියත හා උපකරණ**

| | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| | | රු | රු |
| සින්නක්කර වත්කම් | **8.1** | 723,573,689 | 746,074,569 |
| ගොඩනැගිලි සංවර්ධන පිරිවැය | **8.2** | 223,692,208 | 247,038,787 |
| | | **947,265,898** | **993,113,356** |

**8.1 සින්නක්කර වත්කම්**

| | ඉඩම් | ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍රෝපකරණ | ගෘහ උපකරණ උපාංග හා කාර්යාල උපකරණ | පරිගණක උපාංග | කොටස් | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| පිරිවැය හෝ තක්සේරුව | | | | | | | | |
| **2018 ජනවාරි 1 දිනට ශේෂය** | 395,520,000 | 248,787,761 | 100,567,471 | 58,975,366 | 30,624,103 | 30,511,175 | 45,451,390 | **910,437,266** |
| එකතු කිරීම් | 517,214 | 10,000 | 34,250 | 694,808 | 262,305 | 598,575 | - | **2,117,152** |
| අපහරණ | | | | | | | | - |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **396,037,214** | **248,797,761** | **100,601,721** | **59,670,174** | **30,886,408** | **31,109,750** | **45,451,390** | **912,554,418** |
| අපහරණ | | | (104,399) | | | | | **(104,399)** |
| එකතු කිරීම් | - | - | 299,439 | 488,054 | 2,450,757 | 1,433,624 | - | **4,671,874** |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **396,037,214** | **248,797,761** | **100,796,761** | **60,158,228** | **33,337,165** | **32,543,374** | **45,451,390** | **917,121,893** |
| | | | | | | | | |
| **ක්ෂයවීම්** | | | | | | | | |
| **2018 ජනවාරි 1 දිනට ශේෂය** | - | 27,645,115 | 43,068,106 | 28,573,456 | 29,163,101 | 13,700,149 | - | **142,149,926** |
| වර්ෂය සඳහා අයකිරීම් | - | 4,995,282 | 10,058,905 | 5,905,043 | 309,602 | 3,061,090 | | **24,329,923** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 32,640,397 | 53,127,011 | 34,478,499 | 29,472,703 | 16,761,239 | | **166,479,849** |
| ගැළපුම් 2018 | | 1,207,954 | | | | | | **1,207,954** |
| අපහරණ | | | (67,859) | | | | | **(67,859)** |
| වර්ෂය සඳහා අයකිරීම් | - | 6,203,277 | 10,066,673 | 5,992,428 | 501,649 | 3,164,231 | | **25,928,260** |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **40,051,628** | **63,125,825** | **40,470,927** | **29,974,352** | **19,925,470** | - | **193,548,204** |
| | | | | | | | | |
| ගෙන එන අගයන් | | | | | | | | |
| 2018 දෙසැම්බර් 31 දිනට | 396,037,214 | 216,157,364 | 47,474,710 | 25,191,675 | 1,413,705 | 14,348,511 | 45,451,390 | 746,074,569 |
| **2019 දෙසැම්බර් 31 දිනට** | **396,037,214** | **208,746,133** | **37,670,936** | **19,687,301** | **3,362,813** | **12,617,903** | **45,451,390** | **723,573,689** |

**8.2 ගොඩනැගිලි සංවර්ධන පිරිවැය**

| | 2019 | 2018 |
|---|---|---|
| **පිරිවැය හෝ එසේ සළකන පිරිවැය** | රු | රු |
| ජනවාරි 1 දිනට ශේෂය | 384,452,630 | 384,452,630 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 384,452,630 | 384,452,630 |
| | | |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 1 දිනට ශේෂය | **137,413,843** | **112,073,843** |
| වර්ෂය සඳහා අයකිරීම් | 25,340,002 | 25,340,000 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **162,753,845** | **137,413,843** |
| | | |
| **ගෙන එන අගයන්** | | |
| ජනවාරි 1 දිනට | 247,038,787 | 272,378,787 |
| අතිරේක 2019 | 1,993,423 | |
| **දෙසැම්බර් 31 දිනට** | **223,692,208** | **247,038,787** |

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**8.2** ගොඩනැඟිලි සංවර්ධන පිරිවැය

| ක්‍රමක්ෂය ස්ථානය | වර්ෂය | පිරිවැය | අනුපාතය | 2019 ජනවාරි 01 දිනට සමුච්චිත ක්‍රමක්ෂය ශේෂය | 2019 වර්ෂය තුළ ක්‍රමක්ෂිත | 2019 දෙසැ 31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය ශේෂය | 2019 දෙසැ 31 දිනට ගොඩනැඟිලි සංවර්ධන පිරිවැයේ ගෙන ආ අගයන් |
|---|---|---|---|---|---|---|---|
| කෞතුකාගාරය | 2013 | 172,847,765 | | | | | |
| කෞතුකාගාරය | 2014 | 1,881,295 | | | | | |
| කෞතුකාගාරය | 2015 | 389,177 | | | | | |
| එකතුව | | **175,118,237** | 6% | 53,747,769 | 10,101,214 | 63,848,983 | 111,269,254 |
| බත්තරමුල්ල | 2013 | 117,704,905 | | | | | |
| බත්තරමුල්ල | 2014 | 7,119,771 | | | | | |
| බත්තරමුල්ල | 2015 | 9,744,207 | | | | | |
| එකතුව | | **134,568,883** | 6% | 40,074,048 | 7,762,237 | 47,836,285 | 86,732,598 |
| පින්නවල | 2013 | 10,086,000 | 10% | 6,051,600 | 1,008,600 | 7,060,200 | 3,025,800 |
| වාගොල්ල | 2014 | 810,487 | 10% | 405,242 | 81,049 | 486,291 | 324,196 |
| පේරාදෙණිය | 2013 | 31,657,966 | | | | | |
| පේරාදෙණිය | 2014 | 8,968,353 | | | | | |
| පේරාදෙණිය | 2015 | 677,220 | | | | | |
| එකතුව | | **41,303,539** | 10% | 23,749,844 | 4,130,354 | 27,880,198 | 13,423,341 |
| වැලිපැන්න | 2013 | 10,269,019 | 10% | 6,161,413 | 1,026,902 | 7,188,315 | 3,080,704 |
| තුරහ තරහ පිටිය | 2013 | 1,113,613 | 10% | 668,165 | 111,361 | 779,526 | 334,087 |
| කටුනායක | 2013 | 1,060,000 | 10% | 636,000 | 106,000 | 742,000 | 318,000 |
| උණවටුන | 2013 | 1,000,000 | 10% | 600,000 | 100,000 | 700,000 | 300,000 |
| K-Zone | 2013 | 8,353,071 | 10% | 5,011,841 | 835,306 | 5,847,147 | 2,505,924 |
| තුම්මුල්ල | | 769,781 | 10% | 307,921 | 76,977 | 384,898 | 384,883 |
| නුවර | 2019 | 1,993,423 | 10% | - | - | - | 1,993,423 |
| **මුළු එකතුව** | | **386,446,053** | | **137,413,843** | **25,340,000** | **162,753,843** | **223,692,210** |

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| **9.** තොග | සටහන් | **2019**<br>රු | **2018**<br>රු |
|---|---|---|---|
| ප්‍රදර්ශනාගාර වෙළඳාම පළමු ගුණාත්මක බවින් යුත් නිමි භාණ්ඩ | | 491,902,352 | 443,175,876 |
| දෙවන ගුණාත්මක බවින් යුත් නිමි භාණ්ඩ | | 143,672,118 | 14,810,411 |
| අමුද්‍රව්‍ය හා සිදුකෙරෙමින් පවතින වැඩ | **9.1** | 1,856,110 | 5,397,990 |
| | | **637,430,580** | **463,384,277** |

**9.1අමුද්‍රව්‍ය හා සිදුකෙරෙමින් පවතින වැඩ**

අමුද්‍රව්‍ය හා සිදුකෙරෙමින් පවතින වැඩ යන්නට අභිරුචි කරන ලද සෘජු ඇණවුම් සඳහා නිෂ්පාදිත අයිතම ඇතුළත්

| **10.** වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | සටහන් | **2019**<br>රු | **2018**<br>රු |
|---|---|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | **10.0** | 15,849,569 | 38,689,773 |
| වෙනත් ලැබිය යුතු දෑ | **10.1** | 20,086,262 | 6,367,938 |
| තැන්පතු හා පෙරගෙවුම් | **10.2** | 50,424,338 | 38,000,723 |
| අදාළ ආයතනවලින් ලැබිය යුතු දෑ | **10.3** | - | 25,660,481 |
| | | **86,360,169** | **108,718,915** |
| **10.** වෙළඳ ලැබිය යුතු දෑ | | | |
| වෙළඳ ණය ගැතියන් | | 13,019,327 | 11,030,486 |
| ණයපත්වලින් ලැබිය යුතු | | | |
| | | 2,830,242 | 27,659,287 |
| | | **15,849,569** | **38,689,773** |
| **10.1** වෙනත් ලැබිය යුතු දෑ | | | |
| කාර්ය මණ්ඩල ණය | | 116,250 | 113,750 |
| ලැබිය යුතු කුලී | | 10,921,900 | 315,000 |
| ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු | | 9,049,198 | 5,939,188 |
| ලැබිය යුතු වැට් | | - | - |
| වෙනත් ලැබිය යුතු දෑ | | (1,086) | - |
| වවුචර් අලෙවියෙන් ලැබිය යුතු දෑ | | - | - |
| | | **20,086,262** | **6,367,938** |
| **10.2** තැන්පතු හා පෙරගෙවුම් | | | |
| ඇප තැන්පතු මුදල් | | 1,925,446 | 1,849,424 |
| පෙරගෙවුම් | | 5,706,303 | 8,993,600 |
| ගෙවූ අත්තිකාරම් | | 22,511,554 | 11,932,359 |
| හානි වූ තොග පාලන ගිණුම | | - | - |
| රඳවාගත් මුදල් | | 12,502,564 | 500,000 |
| ආපසු ගෙවීමේ තැන්පතු | | 7,881,157 | 14,715,340 |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය | | 77,993 | - |
| ලැබිය යුතු ඇපකර | | (180,679) | 10,000 |
| | | **50,424,338** | **38,000,723** |
| **10.3** සම්බන්ධිත ආයතනවලින් ලැබිය යුතු දෑ | | | |
| ව්‍යාපෘතිය මඟින් ලැබීමට නියමිත අගයන් | | - | - |
| අපේ ගම මඟින් ලැබීමට නියමිත අගයන් | | - | 25,660,481 |
| | | **-** | **25,660,481** |

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | 2019 | 2018 |
|---|---|---|
| | රු | රු |
| **11. මුදල් හා මුදල් සමාන දෑ** | | |
| බැංකු මුදල් | 26,888,268 | 22,832,694 |
| අතැති මුදල් | 2,041,668 | 1,618,606 |
| | **28,929,936** | **24,451,300** |
| | | |
| **12. ආදායම් සංචිතයේ වෙනත් සංරචක** | | |
| ආරම්භක ශේෂය | 178,017,763 | 38,180,995 |
| හිඟ වැටුප් | - | - |
| පෙර වර්ෂයේ සංශෝධන | (54,488,789) | 139,836,768 |
| | **123,528,974** | **178,017,763** |

සමුච්චිත ආදායම් සංචිත හරහා නැවත සළකා බැලූ පෙර කාලපරිච්ඡේදයන්ට අදාළ සංශෝධන ආදායම් සංචිතයේ වෙනත් සංරචකවල ඇතුළත් වේ.

| | 2019 | 2018 |
|---|---|---|
| | රු | රු |
| **13. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | |
| ආරම්භක ශේෂය | 44,191,479 | 38,062,261 |
| වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන | 7,278,099 | 6,704,212 |
| වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම් | (573,540) | (574,994) |
| අවසාන ශේෂය | **50,896,038** | **44,191,479** |

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා වගකීම, ආයතනයේ සේවකයන් 128 දෙනෙකු ආවරණය වන්නා වූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකි.

**14.විලම්බිත ආදායම**

| ප්‍රදානයේ විස්තර | වර්ෂය | ක්‍රමක්ෂය අනුපාතය | ලැබුණු මුල් ප්‍රදානය | 2018 දෙසැ 31 දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය | 2019 වර්ෂය තුළ ක්‍රමක්ෂිත අගය | 2019 දෙසැ 31 දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය |
|---|---|---|---|---|---|---|
| ආර්ථික සංවර්ධනය | **2012** | 10% | 100,000,000 | 30,000,000 | 10,000,000 | 20,000,000 |
| වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය | **2013** | 10% | 36,000,000 | 14,400,000 | 3,600,000 | 10,800,000 |
| අයවැය ප්‍රතිපාදන | **2013** | 10% | 10,224,643 | 4,089,857 | 1,022,464 | 3,067,393 |
| අයවැය ප්‍රතිපාදන | **2013** | 10% | 42,109,637 | 21,054,818 | 4,210,964 | 16,843,854 |
| අයවැය ප්‍රතිපාදන | **2013** | 10% | 11,099,920 | 4,439,968 | 1,109,992 | 3,329,976 |
| අයවැය ප්‍රතිපාදන | **2013** | 10% | 7,828,426 | 3,131,373 | 782,843 | 2,348,530 |
| ආර්ථික සංවර්ධනය | **2014** | 10% | 35,000,000 | 17,500,000 | 3,500,000 | 14,000,000 |
| අයවැය ප්‍රතිපාදන | **2014** | 10% | 11,137,374 | 5,568,697 | 1,113,737 | 4,454,960 |
| එකතුව | | | **253,400,000** | **100,184,713** | **25,340,000** | **74,844,713** |

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | සටහන් | 2019<br>රු | 2018<br>රු |
|---|---|---|---|
| **15. දීර්ඝ කාලීන ණය** | | | |
| ආරම්භක ශේෂය | | 303,929,372 | 364,484,161 |
| වර්ෂය තුළ ලබා ගත් ණය | | 273,000,000 | 11,700,000 |
| වර්ෂය තුළ ගෙවූ ණය | | (145,202,443) | (72,254,789) |
| අවසාන ශේෂය | | 431,726,929 | 303,929,372 |
| (අඩු කළා) වර්ෂයකින් ගෙවිය යුතු | **17** | (43,076,000) | (139,319,028) |
| **දීර්ඝ කාලීන ණය බැදීම්** | | **388,650,929** | **164,610,344** |

**15.1 ලංකා බැංකුව - 2018 වර්ෂ අවසානයට ණය ශේෂය රු. මිලියන 272**

පූර්වයෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් 2012-2018 කාල සීමාව තුළ රු. මිලි. 950ක ණය මුදල් කොටුව ගොඩනැඟිල්ල උකසට තැබීමෙන් ලබාගෙන ඇත. ලබා ගත් ණය මුදල්වලින් ප්‍රදර්ශනාගාරවල තත්ත්වය ඉහළ නැංවීමෙන් ණය ගෙවීම සඳහා ලක්සල සිය ආදායමේ තිර වර්ධනයක් අත්පත් කරගන්නා ලදී. 2013-2018 දක්වා කාලය තුළ ප්‍රාග්ධන ණය මුදල් පියවා ලංකා බැංකු ණය රු. මිලි. 303.9 දක්වා අඩු කොට ගෙන ඇත.

**15.2** 2019 මූල්‍ය වර්ෂය තුළ පළමු කාර්තුවෙන් පසු පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් ආයතනය පසුබෑමකට ලක් විය. එහෙයින් එවකට පැවති තත්ත්වය සමනය කිරීම සඳහා පැවති ණය ප්‍රතිව්‍යුහගත කරන ලදී. දීර්ඝ කාලීන ණය 08හි හා කෙටි කාලීන චක්‍රීය ණයවල ශේෂ අවලංගු කොට රු. මිලි. 273ක් වූ ශේෂ ණය ප්‍රාග්ධනය 2019 වර්ෂය තුළ අලුත් ණය ලෙස නිකුත් කරන ලදී.
2019 වසරේදී රු. මිලි. 273 සඳහා ගෙවිය යුතු ප්‍රතිව්‍යුහගත ණය සඳහා පහත දැක්වෙන පරිදි ණය 3ක් ලබා දෙන ලදී.
1 පහසුකම - කාලීන ණය රු. 40,000,000/=
2 පහසුකම - කාලීන ණය රු. 200,000,000/=
3 පහසුකම - කාලීන ණය රු. 33,000,000/=

**15.3 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - රු. මිලියන 200**

හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයක් වෙනුවෙන් රු. මිලි. 200ක් වූ ණය පහසුකම 2013 වර්ෂයේදී කැලණිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබා ගන්නා ලදී. මහා භාණ්ඩාගාරය බැංකුව හරහා ණය පහසුකම සලසා දුන් හෙයින් ලක්සල මගින් කිසිදු ඇපයක් ලබා නොදුනි.

**15.4 භාණ්ඩාගාර ණය - රු. මිලියන 15**

සැපයුම්කරුවන් වෙත ගෙවීමට නියමිත ශේෂයන් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් 0% පොළියක් යටතේ ලබා දුන් ණය පහසුකමකි. 2019 දෙවන කාර්තුව වන විට මෙම ණය සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලදී.

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**
**විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **16. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු** | | | |
| වෙළඳ ගෙවිය යුතු | | 338,046,682 | 392,544,616 |
| වෙනත් ගෙවිය යුතු | | 104,787,627 | 101,510,827 |
| උපචිත වියදම් | | 47,475,368 | 29,991,428 |
| | | **490,309,677** | **524,046,871** |
| **17. කෙටි කාලීන ණය** | | | |
| දීර්ඝ කාලීන ණය බැදීමේ වර්තමාන කොටස | | 43,076,000 | 139,319,028 |
| කෙටි කාලීන ණය | | 6,686,719 | 136,069,359 |
| | | **49,762,719** | **275,388,387** |
| **18. බැංකු අයිරා** | | | |
| බැංකු අයිරා | | **6,320,701** | **15,891,004** |

රු.6,320,701 (2018: Rs.15,891,004)ක් වූ බැංකු අයිරාව, වර්ෂ අවසානයට මුදල් පොතේ දැක්වෙන ශේෂය වේ. මූල්‍ය වර්ෂයේදී ලංකා බැංකු ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ බැංකු අයිරා පහසුකම රු. මිලියන 15ක් දක්වා ලබා දීමට අනුමැතියක් ලැබී ඇත.

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**19. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්**

**මණ්ඩලයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු:**

| අධිකරණ අංකය | නඩු ගොනු කළ දිනය | නඩු ගොනු කළ පාර්ශවය | නඩුවේ ස්වභාවය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| DMR/0280/13 | 2015 ජූලි 13 | කෝට්ටේ නගර සභාව | සූර්ය පැනල සවි කිරීම සඳහා වූ ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් කෝට්ටේ නගර සභාව විසින් ලක්සලට එරෙහිව දිස්ත්‍රික් අධිකරණයේ පැවරූ නඩුවකි. | කෝට්ටේ නගර සභාව වෙත පොළිය ද සමඟ රු. 4,020,000ක මුදලක් ගෙවීමට තීන්දු විය. කෙසේ නමුත් ලක්සල මේ සම්බන්ධයෙන් අභියාචනයක් ගොනු කොට ඇත. අධිකරණ තීන්දුව ලබා දී ඇති හෙයින් 2018 දෙසැ. 31 දින වන විට ගෙවිය යුතු ලෙස ඊට සමාන මුදලක් ලබා දුනි. |
| DMR/2255/16 | 2016 මැයි 9 | ඩිමෝ පුද්ගලික සමාගම | ගෙවිය යුතු ශේෂ නොගෙවීම හේතුවෙන් කොන්දේසි කඩ වීම සම්බන්ධයෙන් ඩිමෝ ආයතනය ලක්සලට එරෙහිව දිස්ත්‍රික් අධිකරණයේ පැවරූ නඩුවකි. | තීන්දුව ලැබීමට නියමිත අතර 2018 දෙසැ. 31 දිනට බල පැවතිය හැකි කිසිදු වගකීමක් නොමැත. |
| 138/2018/MR | 2018 මාර්තු 08 | ජැට් හෝල්ඩින්ග්ස් (JAT Holdings) පුද්ගලික සමාගම | ලක්සල මගින් සංචාරක මණ්ඩලය වෙතින් ලබා ගත් කොන්ත්‍රාත්තුවක් ජැට් හෝල්ඩින්ග්ස් සමාගම වෙත උප කොන්ත්‍රාත්තුවක් ලෙස ලබා දීම වෙනුවෙන් ගෙවීමට ඇති රු. 8,184,683.49ක් වූ ගෙවීමක් සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ පැවරූ නඩුවකි. | ලක්සල (ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා සැළකොට ඇත. |
| 139/2018/MR | 2018 අප්‍රේල් 10 | ජැට් හෝල්ඩින්ග්ස් (JAT Holdings) පුද්ගලික සමාගම | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22 වන මහලේ පිහිටි බේරුම්කරණ මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය සඳහා ලක්සල විසින් අධිකරණ අමාත්‍යාංශය සමඟ ගිවිසුමක් අත්සන් තබන ලදී. ලක්සල මෙය උප කොන්ත්‍රාත්තුවක් ලෙස ජැට් හෝල්ඩින්ග්ස් සමාගම වෙත ලබා දී එම කාර්යය සම්පූර්ණ කොට ඇත. එහෙත් එම සමාගම වෙත ගෙවීමට ඉතිරි මුදල් ගෙවා නොමැත. මේ හේතුවෙන් රු. 32,256,980ක මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් ජැට් හෝල්ඩින්ග්ස් සමාගම ලක්සලට එරෙහිව කොළඹ මහාධිකරණයේ පැවරූ නඩුවකි. | ලක්සල (ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා සැළකොට ඇත. |

**අභ්‍යන්තර විමසීම්**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2015 වර්ෂයේ දී වැඩ තහනමට ලක් වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව අභ්‍යන්තර විමසීම් සිදු කෙරෙමින් පවතී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : ටීසීඑම්/ඒ/එස්එල්එච්බී/153/2019/එල්ජී
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2021 ජනවාරි  දින

සභාපති

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- 1. ලේකම් - මුදල් අමාත්‍යාංශය
2. ලේකම් - බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ටීසීඑම්/ජ/පස්ප/ලංවක්/<br>153/2019/ඵළප | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021 ජනවාරි දින |
|---|---|---|---|---|---|

සභාපති

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධ ආයතන පනතේ 64 (3) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.



+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23

## 1.2 අහිතකර මතය සඳහා පදනම

(අ) 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන (සටහන 09) අනුව තොග එකතු වටිනාකම රු.637,430,580 ක් විය. එදිනට විගණනය සඳහා ඉදිරිපත් කළ භෞතික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව තොග වටිනාකම රු.514,227,827 ක් වීම නිසා මූල්‍ය ප්‍රකාශන අනුව තොග වටිනාකම රු.123,202,753 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ස්ථාවර වත්කම් අයිතම 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව එකතු වටිනාකම රු.226,835,528 ක් වුවත්, වත්කම් උපලේඛන අනුව එම වත්කම්වල එකතු වටිනාකම රු.99,793,054 ක් විය. ඒ අනුව එකතුව රු.127,042,474 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලය විගණන අංශයට ඉදිරිපත් කළ උපලේඛනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට වක්‍ර ණයහිමි එකතුව රු.36,241,797 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. නමුත්, එම වක්‍ර ණයහිමි ශේෂය තුළ රු.3,616,379 ක වෙනත් ණයහිමියෝ ලෙස හර ශේෂයක් සටහන් කර තිබීම නිසා සත්‍ය ණයහිමියන් රු.3,616,379 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි.

(ඇ) මණ්ඩලයට අයත් බැංකු ජංගම ගිණුමක 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අයිරා ශේෂය රු.233,662 ක් ලෙස සටහන් කර තිබුණි. ඩොලර් වලින් ගණුදෙනු කරනු ලබන මෙම බැංකු ජංගම ගිණුමේ ශේෂය රුපියල් වලට දෝෂ සහිතව පරිවර්තනය කිරීම නිසා වර්ෂ අවසාන වටිනාකම රු.237,897 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි.

(ඉ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය ශේෂ රු.158,726,932 ක් වුවත්, එම බැංකුව විසින් ලබාදෙන ලද ශේෂ තහවුරු ලිපිය අනුව එදිනට ණය ශේෂය රු.162,109,399 ක් වීම නිසා මූල්‍ය ප්‍රකාශන අනුව රු.3,382,467 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) වර්ෂයේ අගෝස්තු මස ප්‍රදර්ශනාගාර 09 ක ණය කාඩ් පත්‍ර මත අලෙවි එකතු වටිනාකම රු.21,584,455 ක් වුවත්, බැංකුව මණ්ඩලය වෙත ලබාදෙන එම මස අලෙවි සාරාංශ වාර්තා (Merchant Detail Transaction Report) අනුව මුළු අලෙවිය රු.20,150,754 ක් වීම නිසා එකතුව රු.1,433,701 ක වෙනසක් නිරීක්ණය විය.

(උ) 2019 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ හිඟ බදු වාර්තාව අනුව මණ්ඩලය ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) වටිනාකම රු.26,498,593 ක් විය. එදිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම බදු වටිනාකම රු.11,602,282 ක් වීම නිසා ගෙවිය යුතු බදු වටිනාකම රු.14,896,311 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි.

(ඌ) 2019 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ හිඟ බදු වාර්තාව අනුව මණ්ඩලය ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT) ශේෂය රු.3,858,970 ක් විය. එදිනට මණ්ඩලයේ ගිණුම් අනුව එම බදු වටිනාකම රු.2,108,828 ක් වීම නිසා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.1,750,142 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) 2019 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ හිඟ බදු වාර්තාව අනුව මණ්ඩලය ගෙවිය යුතු ආදායම් බදු වටිනාකම රු.20,811,536 ක් විය. එදිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම බදු වටිනාකම රු.25,459,280 ක් වීම නිසා ගෙවිය යුතු ආදායම් බදු වටිනාකම රු.4,647,744 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කලින් ගෙවීම් යටතේ රඳවා ගැනීම් මුදල් ලෙස එකතුව රු.12,502,564 ක් විය. 2011 සහ 2015 වර්ෂවල සිට ඉදිරියට එන මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. ඒ පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ඔ) 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ලැබිය යුතු ක්‍රෙඩිට් කාඩ් ගිණුම පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂය තුළ ජර්නල් සටහනක් භාවිතා කර එකතුව රු.26,151,430 ක් එම ලෙජර් ගිණුම බැර කර, එම වටිනාකම පෙර වර්ෂයේ ගැළපීම් ගිණුම හර කර තිබුණි. මෙම ජර්නල් සටහන ගිණුම්ගත කිරීමේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා එම වටිනාකම ගණනය කළ ආකාරය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ඕ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලයේ නොපියවූ අත්තිකාරම් එකතු වටිනාකම රු.22,511,554 ක් විය. එම අත්තිකාරම් වටිනාකමේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා අත්තිකාරම් උපලේඛන සහ ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ක) 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වෙළඳ ණයගැති ශේෂ එකතුව රු.22,597,699 ක් වූ අතර, එම ණයගැති ශේෂයෙන් එකතුව රු.9,578,372 ක් අඩමාණ ණය සඳහා වෙන් කිරීම සිදු කර ශුද්ධ ණයගැති වටිනාකම වූ එකතුව රු.13,019,327 ක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. එම ශුද්ධ ණයගැති ශේෂයේ නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා ශේෂ සනාථන සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදි. තවද එකතුව රු.9,578,372 ක් අඩමාණ ණය සඳහා වෙන් කිරීම සිදු කර තිබුණද, ඒ සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ග) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු කුළී ලෙස සටහන් කර තිබූ එකතුව රු.10,921,900 ක වටිනාකම තුළ ඇතුළත් වූ රු.1,133,557 ක වටිනාකම 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන පැරණි ශේෂයක් විය. එම ශේෂයේ නිරවද්‍යතාව පරීක්ෂාව සඳහා සාක්ෂි මණ්ඩලය සතුව නොතිබුණි.

(ච) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් ලෙස රු.47,475,368 ක් සටහන් කර තිබුණි. එම එකතු වටිනාකමට අදාළව විගණනයට ඉදිරිපත් කළ උපලේඛනය තුළ රු.6,792,561 ක් පසුගිය වර්ෂයේද උපචිත වියදම් ලෙස සටහන් කර තිබූ අතර, එම වටිනාකම පිළිබඳ ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එහි නිරවද්‍යතාව පරීක්ෂා කළ නොහැකි විය.

(ජ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ වන ගිණුම්කරණ ප්‍රමිතයේ 110 වන ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව ගිණුම්කරණ වැරදීම් අතීතානුයෝගීව ගැලපීමේදී රඳවාගත් ඉපයීම් ගිණුමේ ආරම්භක ශේෂයට ගැළපීම් කළ යුතු වුවත්, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කිරීමේදී රු.54,488,789 ක් වූ පෙර වර්ෂයේ වැරදීම් රඳවාගත් ඉපයීම් ගිණුමේ ආරම්භක ශේෂයට ගැළපීම් නොකර පූර්ව වර්ෂ ගැළපීම් ලෙස වෙනම තීරුවක ගැළපීම් කර තිබුණි.

(ට) මණ්ඩලයේ ගිණුම් තැබීම සඳහා SAP සහ POS නමින් පරිගණක වැඩසටහන් 02 ක් භාවිතා කරයි. මෙම පද්ධති දෙක අතර දත්ත හුවමාරු සඳහා දෛනිකව ස්වයංක්‍රියව විශාල ජර්නල් සටහන් සංඛ්‍යාවක් ගිණුම්ගත වේ. කිසිදු පුද්ගල මැදිහත් වීමකින් තොරව සටහන් වන මෙම ගණුදෙනු මඟින් දෛනිකව මුදල් පොතටද ජර්නල් සටහන් මඟින් ගණුදෙනු ගිණුම්ගත කරයි. නියැදි පරීක්ෂාවන් අනුව 2019 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී මුදල් පොතේ හරට එකතුව රු.8.115.546 ක්

සහ බැරකම් එකතුව රු.42,776,136 ක් ගිණුම්ගත වී තිබූ අතර, ඒ සඳහා ජර්නල් වවුචර් සහ ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා එවායේ නිරවද්‍යතාවය පරීක්ෂා කළ නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ අභිනත මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,විගණනය සඳහා අවශ්‍ය සියලූ තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නොතිබුණි.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ), (ඇ), (ඈ), (ඉ), (ඍ), (ඕ), (ච) සහ (ට) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණවලට යටත්ව යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති / විධානයට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) 9.3.1 (vi) සහ (vii) වගන්ති | මෙම වගන්ති ප්‍රකාරව මාස 03 ක උපරිම කාලපරිච්ඡේදයක් සඳහා වැඩබැලීමේ පත්වීම් ලබාදිය යුතු වුවත්, 2015, 2018 වර්ෂවල සිට 2020 නොවැම්බර් මස දක්වා මණ්ඩලයේ ප්‍රධාන තනතුරු 05 ක් සඳහා වැඩබැලීමේ පත්වීම් ලබාදී තිබුණි. |
| (ii) 9.14.1 සහ 9.14.2 | මෙම චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය පරිපාටි රීති සකස් කර ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී / අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ කොන්ත්‍රාත් සේවා කාලය අවසන් වීම සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක විශ්‍රාම යාම නිසා 2020 පෙබරවාරි මස සිට මෙම තනතුරු පුරප්පාඩු වී තිබුණි. විගණිත 2020 නොවැම්බර් මස දක්වා එම පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම නිසා අභ්‍යන්තර විගණන අංශය අක්‍රිය වී තිබූ අතර, මණ්ඩලයේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු සහ තීරණ ගැනීම් බෙහෙවින් ප්‍රමාද වීම මණ්ඩලයේ පැවැත්ම සඳහා අහිතකර ලෙස බලපෑම් ඇති කර තිබුණි.

(ආ) මණ්ඩලයේ ගිණුම් තැබීම සහ තොග පාලනය සඳහා SAP නැමති මෘදුකාංගය භාවිතා කරන අතර, දෛනික විකුණුම් සඳහා POS නැමති මෘදුකාංගය භාවිතා කරයි. මෙම මෘදුකාංග දීර්ඝ කාලයක සිට භාවිතා කළද, එම මෘදුකාංග වලට අදාළ මව් සමාගම් සමඟ සේවා ගිවිසුම් යාවත්කාලින කර නොතිබුණි. එසේ සේවා ගිවිසුම් යාවත්කාලින නොකිරීම නිසා මෙම මෘදුකාංග වල නව සංස්කරණයන් (New Version) සහ වැඩිදියුණු කිරිම් අහිමි වී තිබුණි. ආයතනයේ දත්ත Back Up ලෙස තබාගෙන තිබුණද, හදිසි අවස්ථාවක එම දත්ත පද්ධතියට යළි ඇතුළත් කිරීමට නොහැකි වීම නිසා (Reinstallation) පද්ධතිය තුළ පවතින ආයතනයේ දත්ත සම්බන්ධව විශාල අවධානමක් පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති